# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2391/11 - 2024 ජූලි මස 02 වැනි අඟහරුවාදා - 2024.07.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : BD/BD/LND/3/5/46.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2016/WS/508.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළයේ, අංක 78 B බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ බදුල්ල නැගෙනහිර (කොට්ඨාස අංක 06 බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ මැනුම්පති විසින් පිළියෙල කරන ලද මු.පි.බ 756 හි කැබලි අංක 1 දැක්වෙන ඉඩම අතරින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0126 ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංකය 01**

ඉඩමේ නම: ඔයවේලෙන; ඉඩමේ විස්තර: තාවකාලික මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0126.

*උතුරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ හිමිකරු සොයාගත නොහැකි ඔයවේලෙන වත්ත; *නැගෙනහිරට* : හිමිකරු සොයාගත නොහැකි ඔයවේලෙන වත්ත සහ බදුලු ඔය; *දකුණට* : බදුලු ඔය සහ හිමිකරු සොයාගත නොහැකි ඔයවේලෙන වත්ත; *බටහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි, ඒ ඉඩම් කැබැල්ල සඳහා පහත නියම කර ඇති වේලාවට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| *පරීක්ෂණ දිනය* | *වේලාව* | *කැබලි අංක* |
|---|---|---|
| 2024.08.08 | පෙ.ව. 10.00 | 1 |

තවද, 2024.08.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

තුෂාරි අනුරාධා නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 07-0014

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2013/PC/595.
*මගේ අංකය* : KDS/UNU/4/6/LA/ප්‍රා.ස./ මාර්ග.

මා විසින් 2024 ජනවාරි මස 06 වැනි දින අංක 2365/74 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 අගෝස්තු මස 07 වැනි දින පෙ.ව. 10.00ට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2024 අගෝස්තු මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු යි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2024 ජුනි මස 24 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 07-0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.